
# මිහිරි මතක
# දරුවන්ට ආදරෙන්



ජී. එච්. ඒ. එන්. සමන්මලී

# මිහිරි මතක

# දරුවන්ට ආදරෙන්






ප්‍රථම මුද්‍රණය - 2021-01-15

දෙවන මුද්‍රණය - 2025-02-08

(සංශෝධන සහිත)

කවි සිතුවිලි - ජී. එච්. ඒ. එන්. සමන්මලී

පිටකවරයේ චිත්‍රය - අමූර්තා ගොඩගේ

ඇතුළත චිත්‍ර - සතිනි යෙතුම්සා වීරසිංහ,

මිනෝලි නෙතනායා

නෙතිනි සෙයාරා කල්පගේ

යශේලි ගෝනගල

සෙනුලි මෙනන්

ඉනුකි ලිතුම්සා බණ්ඩාර

මහාමායා බා.වි - ප්‍රාථමික අංශය

කර්තෘ ප්‍රකාශයකි -

ISBN අංකය - 978-624-206-555-7

පිදුම

හිමිදිරි උදෑසන පිපී,

කෝපි මලක් තුලින්,

විශ්වයේ සුන්දරත්වය දකින්නටත්....

කුරුලු ගීතයක් සේ

සැහැල්ලු ව,

ජීවිතය ගයා යන්නටත්..

දිවි මගේ හමුවන සැමගේ,

සොඳුරු යහගුණ අගයමින් සතුටින් ම  හිඳින්නටත්,

ළතෙත් හිතක් ඇතිව මා වැඩූ

දෙව්ලොව සිට නිරතුරුව මා රකිනා

ආදරණීය මෑණියන්ටත්, පියාණන්ටත්,

දිවි ගමනේ

සොඳුරු ම ගීයට අත්වැල වූ,

එරන්ද ඒකනායක, මාගේ ආදරණීය සැමියාටත්,

කුසහොත් දින පටන් ම

මාගේ හුස්මට මිහිරියාව ම වඩන

මා පණ වන් සෙතුම් පුතුටත්,

මා ගුරු දිවිය තුටු කළ,

සුවහසක් දරු කැළටත්,

දිරියෙන් ම ගුරු අම්මාවක වන්නට තරම් සෙනෙහසින් ළඟ හිඳින,

සොඳුරු මහාමායාවේ 4B(2019/3C 2020/4B 2023/3A 2024) පන්තිවල

මාගේ ආදරණීය  සිසු දියණිවරුන්ටත්,

“මිහිරි මතක -දරුවන්ට ආදරෙන්

තුටු සිතින් පුදමි.”

## පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්ශනශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානික වූ ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වූ භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ. ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි. ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හාරහා සිදු කිරීම වඩාත් ඵලදායි වෙයි.

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි.

මෙවර අප පාසලේ ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණ ගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් වීම ප්‍රශංසනීය කරුණකි. ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

## ස්තුතිය........

පොතක් නම් කවර අරුමයක් ද?

ගුරු දිවියේ අරුමැසි මතක මුවින් කියනු මිස

මේ පුංචි රස මතක ලියන්නට යැයි කියා දිරිය දුන් අය මෙය.

සොඳුරු මහා මායාවේ  මට හමු වූ සංවේදී ම හිත

රංජනී සෙන්දනායක ගුරු අම්මාට

නුවර අහස යට හමු වූ සියළු කල්හි එක්ව හිඳි අපූරු යහළු යෙහෙළියන්ට

පිටකවරයේ චිත්‍රය සහ සෙසු චිත්‍ර ඇඳ දුන් මාගේ ආදරණීය පුංචි මහාමායා දියණිවරුන්ට,

ළෙංගතුව ළඟ හිඳින මහාමායාවේ කුඩා දියණිවරුන් සැමට

බොහෝ දේ ලියන්නට කියවන්නට කාලය වෙන්කර දෙන ආදරණීය සැමියාට සහ සෙතුම් පුතණුවන්ට

මාගේ සෙනෙහසේ ප්‍රණාමය හිමිවිය යුතුමය.



# මතක සුවඳ

## (කතෘගේ සටහන)

“ හෙරණගත්කරණී ” - **2024**, පාසල් දරුවන් තුළ ග්‍රන්ථකරණ සංස්කෘතියක් ගොඩ නගන්නට මුල් වූ මහනුවර මහාමායා බාලිකාවියන් මෙවර විශ්ව ළමා කැළ හා එක්ව විද්‍යුත් කෘති රචනා කරන අතර ම සිය ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා **2568** නමක් හා එක්ව පොත් ලියා එළිදක්වන ව්‍යාපෘතිය වෙනුවෙන් ග්‍රන්ථ රචනා කරන මහාමායා බාලිකාවේ කුඩා දියණිවරුන්ට ආදර්ශයක් ලෙස ගුරු දිවියේ ලද අත්දැකීම් ද ඇසුරෙන් ලියූ මිහිරි මතක (දරුවන්ට ආදරෙන්) නම් වූ මෙම කෘතිය නව සංස්කරණයක් ලෙස සකස් කරන ලදී.

ව්‍යාපෘතිය වෙනුවෙන් ග්‍රන්ථ රචනා කළ ලෝකවාසී සියලු පාසල් දරුවන්ගේ ලේඛන හැකියාවන් අද වන විට ජාත්‍යන්තරය වෙත ගෙනයාම දක්වා මෙහි නිර්මාතෘ සෙනෙවිරත්න මහලේකම්ගේ ගුරුතුමා සමඟ එක්ව අප පාසල විසින් විවිධ ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

එතුමා විසින් ගත්කරණී - **2019**, මධ්‍යම පළාතේ පාසල් දරුවන් **5000** ක් පමණ පොත් රචනා කිරීමට යොමු කිරීම, කොවිඩ් නිවාඩු සමයේ පාසල් දරුවන් **50000**කටත් වඩා පොත් රචනා කළ අකුරු කරන නිවාඩුවෙන් රටක් වටින පොතක් - **(2020)**, ලංකාවේ සියලු පාසල් දරුවන්ට විවෘත වූ ව්‍යාපෘතිය සහ මහාමායා පන්හිඳෙන් දළදා උපහාර **(2021** ජනවාරි **15)** ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තියෙන් වසර **2564** ක් ගතවීම සිහිකොට මහාමායා දියණිවරුන් පුමුඛ පාසල් ප්‍රජාව විසින් පොත් **2564** ක් නිමකරන ලදි. දිවිය දිනන විද්‍යුත් පොතක් **-2023,** ලංකාවේ සියළු පාසල් දරුවන් එක්ව විද්‍යුත් කෘති රචනා කිරීම යන මෙම ව්‍යාපෘතීන් සියල්ලට ම, සම්බන්ධීකාරකවරිය ලෙස පාසල වෙනුවෙන් ක්‍රියාකාරීව සම්බන්ධ වීමේ අවස්ථාව මටද හිමිවීම සතුටකි.

පාසල මූලිකත්වයෙන් ගන්නා මෙම නවතම උත්සාහය “ හෙරණගත්කරණී ” - **2024** ව්‍යාපෘතියේ මහාමායා බාලිකා විදුහලේ ප්‍රාථමික අංශයේ ආචාර්යවරියක ලෙස සහ මෙහි ව්‍යාපෘති සම්බන්ධීකාරකවරියක වශයෙන් ලෝකවාසී දරුවන් දහසකටත් වඩා පිරිසක් විද්‍යුත් පොත් රචනා කිරීමට යොමු කිරීමට ලැබීම ගුරුදිවියේ ලද භාග්‍යයක් කොට සලකමි.

ශ්‍රී ලංකාවේ පාසලක් විසින් ලෝකවාසී දරුවන් වෙනුවෙන් මෙවැනි විද්‍යුත් පොත් රචනා කිරීමේ ව්‍යාපෘතියට යොමු වූ පළමු අවස්ථාව මෙයයි.

උපුටා ගැනීම - යළි උපන්නෙමි. (ජී. එච්.ඒ.එන්. සමන්මලී) පිටු අංක vii, viii, ix

(තවත් සංවේදී කතාවක් ඇත. නොකියාම බැරි.) මා ඇතැර මගේ ආදරණීය මෑණියන් දෙව්ලොව ගොස් වසරක් ඉක්ම ගොස් ය. මෑණියන්ගේ වියෝවෙන් තුන් මසක් පිරෙන දා මහගෙදර අස්පස් කරද්දී ඈ සතුව පැවති ඇඳුම් අල්මාරියෙන්, අප කුඩා කල ඇඳි ස්මෝක් කළ සිහිනි ඇඳුම් කිහිපයක් තුළ ඔතා තිබූ... මා තුන ශ්‍රේණියේ කුඩා සිසුවියක වී සිටියදී ගෙතූ පළමු කතාන්දර ලියූ කහ පැහැ වුණු කොළ කිහිපය හමු වූ හද කම්පා කරන සිදුවීම නොවන්නට...

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය වෙනුවෙන් පාසලේ දූ දරුවන්ගේ සහභාගීත්වය තහවුරු කරනු පිණිස.. දැඩි ඉවසීමෙන් මා සතු සියලු ශක්තීන් වැය කරන්නට මා හට නොසිතෙන්නට ද පුළුවන.. අද මාගේ පාසලේ කුඩා දූ වරුන් සිය ගණනක් කතෘ නාමයෙන් පිදුම් ලබද්දී, දූවරුන්ගේ දෙමව්පියන් ගේ ඇස්වල රැඳි සතුටු කඳුළු දකින විට, එදා ඒ පත් කියවා මගේ මෑණියන් කොපමණ සතුටක් ලබන්නට ඇත්දැයි මට දැනෙයි. පුරා වසර 34 ක් ආදරය සමඟ ඒ පත්තිරු සඟවා තබාගත් මගේ ආදරණීය මෑණියන් නමට, මා කුඩා කල බුහුටියට කතා ගොතද්දී හූ මිටි තබමින් බලා සිට, ඉඩක් ලද සැම විටම කතන්දර පොත් රැසක් ගෙනැවිත් මා අසල තැබූ මා ආදරණීය පියාණන් නමට... මේ උත්සාහයේ දී මා ලද පිනක් වේ නම්, අනුමෝදන් වේවා යි ප්‍රාර්ථනා කරමි.

දයාබර දරුවනි, පොත පත කියවන්නට, ලියන්නට, අලුතින් හිතන්නට, හෘදය සංවේදී වන්නට, එකිනෙකා කෙරෙහි මානව දයා සිතුවිලි ඇති කර ගන්නට සියළු අභියෝග මැද යහපත් දේම පමණක් කරන්නට ඔබේ නිර්මාණශීලී සිතුවිලි හෙට දවසේ යොමු වූවහොත් අප ලබන අග්‍රඵලය එයයි. (උපුටා ගැනීම අවසන්.)

ඔබ සැමට දළදා සමිඳු පිහිටයි........!

ජී. එච්. ඒ. එන්. සමන්මලී මිය.

හෙරණගත්කරණී -2024

ව්‍යාපෘති සම්බන්ධීකාරිකා

මහාමායා බාලිකා විද්‍යාලය

(ප්‍රාථමික අංශය)

මහනුවර.

2025- පෙබරවාරි 08

## පූර්විකාව

**2015-05-08 දින උදේ 8.05 ට**

මහාමායා මව් ඇකයේ පළමු දිනය සාඩම්බර ලෙස ගතවුණි.

හුරු සුවඳ නැත. හුරු පුරුදු පරිසරය දකිනු නැත.

ළතෙක් කඩහඬකින් ඇසුණු පළමු වදන " වාඩිවෙන්න." හිත ප්‍රහර්ෂයකින් පිරී ගියේය.

කරුණාබරිත ගරු සපිරි දයාබර වූවනක්.

පළමු දසුන පියකරුයි.

හැදුණා හිත. දැනුණා සැහැල්ලුවක්.හුරු සුවඳක් දැනුණි.

(අදටත් ඈ මගේ හොඳ ම යෙහෙළිය, ළබැදිනිය ලිව්වේ ඈ වෙනුවෙන්.)

සිනා පිරි පුංචි බාලිකා පැංචියන් රැළක් "ගුඩ් මෝර්නිං මැඩම්". ඇසුණා, නුපුරුදු කටහඬවල් ගොඩක් නමුත් හරිම ආදරෙන්.

ගුරු හුරු සුවඳ බෙදන්නට අපූරු තක්සලාවකට පා තැබූ මොහොත.

"හෙළ බොදු කතුන්" දැයට දායාද කරන මෙහෙයුම ඇරඹුණා වගෙයි.

නුපුරුදු වටපිටාව, සිනා අහිමි මුහුණු, ඉඟි කළා දුෂ්කර බව ගමන් මග.

අභියෝග මහමෙරක් ඇති උරින්, හදවතින් දරන්නට....

පින් පුරා ඇත කප්පරක්, නියත විවරණ ලැබුවෙමි. දහස් මුවින් බෝධිසත් ගුණෝපේත උතුම් ගුරු මෙහෙවරට....

දැන් ඉතින් කාලයයි, අලුත් කෙතක රන් අස්වනු පුදිනා අයුරු දකින්නට.....

අවසරයි........ !

දළදා හාමුදුරුවනේ, ඔබ අභිසෙස් ලද මේ බිම සිප් කිරෙන් සනසා පුංචි ළමා පැටවුන් හිස අත හදවත ගුණ නැණ දහමින් බබළවන්නට....................

## 01.ලැබෑදිනිය

කෝපි මල් හිනා පිරි

දසන් මුව පියකරුයි

මව් ගුණය පුරෝගත්

ළමැද උණුසුම වැඩියි...............

සුමුදු අත් ලිහී ගිය

මතක  හරි ලෙන්ගතුයි

දුර ගියද සා පැටව්

ළඟක බව නිති හැගෙයි.............

දුර ඈත සංසාරේ

හමු වුණා මෙන් දැනෙයි

සිනා පිරි නුඹෙ වදන්

අපට ජීවය ගෙනෙයි...............

දෙව් බඹුන් සුර රජුන්

නුඹ රකින බව සැබැයි

ත්‍රිවිධ රත්නයේ අසිරි

නුඹ රකින බව සැබැයි...............

කාරුණික සිතැත්තී

සෙනෙහෙබර මුවැත්තී

සුබ ම සුබ හෙට දිනක්

නුඹට හිමි ලතෙත්තී



(රංජනී සෙන්දනායක ගුරු අම්මාට ආදරෙන්)

## 02. දහ මල්ල සිල් අරන්

දහ මල්ල සිල් අරන්

සුදු වතින් සැරසිලා

දොහොත් මුදුනේ බැඳන්,

බැති බරව පේ වෙලා......



දන් පොදක් බෙදන්නට

පින් සිතින් ලංවෙලා.....

ඉතින් නැහැනේ ඉඩක්,

කොරෝනා ඇවිල්ලා......

පුංචි හිත ඇහැරෙද්දී

හීනෙකින් නැගිටලා

කියා දුන් ගුණ දහම්,

අගය වෙයි මතු දිනා........

හැදුනොතින් හරි හොඳින්

දුවක සේ නුවණිනා

ආදරෙයි හැමදාම

ගුරු දෙගුරු සතුටිනා........

(පන්තියේ දහමල්ල සිල් අරන්)

## 3. Online ඉස්කෝලේ

Online ඉස්කෝලෙ,
අද තමයි යාළුවේ,
ඊයෙ ගම ආ හින්දා,
නැනේ Signal මෙහේ,

පාඩමේ රස ඉතින්,
මැව් මැව් පෙනෙන්නේ,
කඳුළකුත් නැග ඇවිත්,
ඇස් කොනින් බේරුණේ,

අඹ ගහේ මුදුනටම,
යන්නමයි සිතෙන්නේ,
වාහනේ වහල මත,
නැග ඉතින් බලන්නේ...

waaaw මේ තියෙන්නේ,
හරි හොඳට Signaluth"
ඉදගත්තේ පහසුවට,
හිනාවක් පුරෝගෙන
Log වෙද්දි පාඩමට,
ඇහුණා මට ආදරෙන්,
කෝ මගේ අනුගි දූ,
Madam ගේ කටහඬින්,



මන් මෙහේ වහල උඩ,
කියූ විට සන්තොසින්,
හිනැහුණා කවුරුත්ම,
හි හි හි හී හඬ දෙමින්
සතුට බෝමයි ඉතින්

උනන්දුව තිබේනම්,
හිතත් එඩිතරයි නම්,
ජීවිතය දිනන්නට,
මේක හොඳ පාඩමක්.........

නිමිත්ත - ඈත ගමක ගිය වේලේ Signal නැති නිසා Online පාඩමට Log වෙන්න Signal සොයාගෙන අනුගි දූව ගියාලු කාර් එකේ වහලට.

## 04. තනිවෙලා බුදු සාදු



සිනා කිව් බිව්ය මැද
පන්තියම එළි කරන
මල් කැකුළු කොහෙ ගියද,
තනිවෙලා බුදු සාදු.......

දොහොත් මුදුනේ බැඳන්
සෙත් පිරිත් කවි ගැයූ
පුංචි උවැසියන් නැත.
තනිවෙලා බුදුසාදු .......

අලුත් හීනත් අරන්
පුංචි හිත් වඩිනතුරු
තනිවෙලා මග බලයි
මෙත් සිතින් බුදුසාදු.......

නිමිත්ත - (කොරෝනා නිවාඩුවේ අහම්බෙන් පන්ති කාමරයට ගොඩ වැදුණු ගුරුතුමී බුදු සමිඳු වැඩි කුටිය දෙස බලයි) 2020-05-29

## 5. ගුරු පැතුම



නුඹට ජය සිහසුන තනන්නට

නැණ සුවඳ මල් පුබුදුවන්නට

පුරන් කෙත රන් වියැට වපුරා

ඩා කඳුළු බිඳු පොහොර කරවා

ප්‍රාණ සමකොට සුරැකි නුඹ ලොව

පුදිනා තුරු සාර අස්වනු

බලා හිඳිනෙමු වෙහෙස සහවා

නුඹේ ජය හඬ රැව් නැගෙන දින

මුළු ලොවම සතුවේය මා අත

දිරිව එඩියෙන් එක්ව එනු මැන

ජය කිරුළු වෙත පා නගන්නට

**2023-10-01** ළමා දිනය දා

## 6. දූවරුන් දිනූ ගුරුතුමියට

1\. හිනා මුවින් සැරසිච්චි
පුංචි හීන එළිවෙච්චි
ගුරුතුමියත් හීන අරන්
අපි හොයාන පැමිණෙච්චී

2\. අපේ අම්මා ඇය තමාලු
දූ පැටවුන් අපි තමාලු
එකතු වෙලා අපූරුවට
හරිම රස කතා ගොතාලු

3\. ගණන් හරිම ලේසීලු
එකමුතුකම අපූරුයිලු
ආදරයෙන් කියාදුන්නු
මිනිස්කමයි හරි අපූරු

4\. කරුණාවෙන් ඇස් පුරෝන
ආදරයෙන් තුටින් බෝම
ලොවම දිනන දිරිය දෝණි
වෙන්න පැතුවෙ අපි හැමෝම

5\. එක් වී සඳ තරුත් සේම
සුවිසල් රුක් සේ වැඩෙමුය
ලොවට සිසිල සෙවණද දෙන
ගුරුතුමියනි අපේ ලොවට


6\. සෙනෙහස දූන් මහිම
පින් පුරණෙමු නුඹේ නමට
උත්තම ගුරු පුද
ලැබුමට.................



# 7. සැරද.....! මහාමායා මව්නි........

1) නුවර වැවේ වැව් දිය රැලි
තාලයකට නටනවාලු
සිරි දළදා රැස් දහර ම
මෙපින් කිමට අසිරි දේ ලූ.....//

2) සිරි ලංකාවේ සුපතල
බබළන අපගේ පාසල
දියණිවරුන් එකමුතුවෙන්
යහමඟ යති නැග පඩිපෙළ....//



3) හෙළ බොදු කුල කත සේ මා
රුවින් ගුණෙන් නිති බෝමා
මහාමායා පුවත සොයා
අතීතයට යමු සැවොමා....//

4) එක්දහස් නවසිය තිස්දෙක
හරි ම අපූරුයි වසර ම
ජනවාරි යේ දාහතර ම
එකළු වුණා පුරවරය ම....//

5) කරදන අත්තදස්සි හිමිගේ
මෙත් කරුණා ගුණ මහිමෙන්
සදාචාර කුළඟන සමිතිය
ඉටුකළ මෙහෙවරිනේ..//

6) රත්වත්තේ මැතිඳුන්ගේ
චිත්‍රාවෝ මැතිණියගේ
බෙනට් සොයිසා මැතිඳුන්ගේ
සේරා අපෙ මැතිණියගේ..//

7) බෞද්ධ බාලිකා පාසල
ඇරඹුණු බව පතල වේලු..
හිල්ඩා කුලරත්න මැතිණි
මුල් විදුපති තුමිය වේලු..//

8) අනගාරික ධර්මපාල
නාමය නිති රැව්දේවී..
දුන්නු පිනින් සිය නිවස ම
අදටත් රුව බැබලේවී..//

9) එදා මෙදා තුළ මෙහෙ කළ
මායා පින්කෙත වපුරන
උතුම් හිතැති
සියලු දනා
සිහිකරන්නෙ හද බැතියෙන..//

10) විදූ නැණ සපිරුණු කුමරිය
යහගුණයෙන් ඔපය වේලු..
ගුණ සුවඳින් පිරුණු දියණි..
සමන් පිච්ච මලක් සේ ලූ...//



11) රෙබරෝසියා මල් ගොමුවේ..
මෘදු කරුණා ගුණ පැතිරේ..
අභිමානය මුළු ලොවට ම
අපෙ දියණිය හුරු කෙරුවේ...//

12) කෙළිසෙල්ලම් පිට්ටෙනියේ
ජය ඝෝෂා රැව්දෙන්නේ..
මහාමායා දිනූ නාමය
සක්වලට ම හඬ නැගුණේ.//

13) මනස හදවතේ දැතේ..
මතු දියුණේ නිපුණ වේ ලු..
දිරිය කතක ලෙස හැඩකොට
දිවි ගිමියෙන් සුවය දේ ලු..//

14) ගුරු ඇදුරිඳු සෙනෙහසිනේ..
කරුණාබර ගුණ වරුණේ..
මහාමායා බිම සුවඳයි..
දූ වරුනට දෙන ප්‍රේමේ..//

15) වසර අනූවයි හෙට දින
විදූ පියසට උපන්දිනේ,
කිතුගොස නිති පැතිරේවා
මහාමායා මැණියගේ..//




16) ආයු වර්ණ සැප බලයෙන්
මුලු නුවරට සුව දේවා
අසා උන්නු හැමදෙනාට
තුති කුසුමන් සැරදේවා...///

සංකල්පනාව
මහාමායාවට සෙනෙහසින්
සමන්මලී ගුරුතුමිය
මහාමායා බාලිකා විදූහල
ප්‍රාථමික අංශය
මහනුවර

# 8. වඩිනු මැනවි




පලවා සියලු රෝ බිය
නිවා දිවි ගමන සරතැස
දම් ගගුල අම ඔසුව
සනසවා ලක් මැණියන්........

වඩවා කුළුණු ගුණ සිත්
සාදවා දිරි එඩිව  ලක් සිත්
පහන් ටැඹ වෙත එළිය දෙන්නට
වඩින්නට මේ කාලයයි

පාරමී ගුණ වඩා අහවර
සියලු සත වෙත පූදා ලකඹර
රෝග සිත් නිවනා වූ දිව ඔසු
සොය එන්නට කාලයයි.......

සරා සඳ සේ දහම් අඹරේ
ඔබ හිඳින විට උතුම් සිත් සේ
සාධු සාධු වදිමි නුවණින්
පෙළට එක්වී සරු සිතින්

# 9 . ආදරණීය අම්මාට



**1.** සීත අරණේ
සුමුදු සළුවක
හොවා මුදු ගුණ
උදේ හිරුටත්
කලින් පිබිදී
ලිපේ ගිණිදැල්
අවුලුවන්නේ
ගමට හිරු වූ
අපේ අම්මා.........

**2.** සිතට ඉසුඹුව
නොලද පැසසුම්
හිනා මුව අග
රන්දනා .........
වෙල නියර දිග
සැඳෑ අව්වේ
පියමනින්නේ
අපේ අම්මා .........

**3.** සසර බුදුගුණ
දොහොත් මුදුනත
සැදැහැ උවැසිය
වී සෙමෙන්
උතුම් මෙත් සිත
වඩා මව් ගුණ
පිරිමදින්නේ
අපේ අම්මා.........

**4.** සඳා මලසුන
මලින් පිරිසිදු
මහඳ බුදුරුව
වී සොඳින්.........
මගේ ලෝකය
එළිය කරවූ
සඳවතිය නුඹ
මගේ අම්මා.........

මෙත් බුදුන් දැක
උතුම් නිවනින් සැනසේවි මගේ උතුම් අම්මා...
**(2023 නොවැම්බර් 20)**

## 10.අපේ ගුරුතුමීට........



පේනවාද දරුවනේ  - අර ඈත මල් ගොමුව

සුවඳ ලස්සන ගොඩයි - නෙළා ගත් දෝතටම..........

අනේ අපේ ගුරුතුමී - කොහොම ළංවෙමු ද අපි

නෙළන්නට ආස මුත් - දුර පෙනෙන මල් පොකුර

රළු බොරළු මාවතයි - විස පිරුණු කටු ගොඩයි

පුංචි පා රිදේවි - පපුවේ කටු ඇනේවි

වෙර ගනින් පැටවුනේ - නුඹලාට සවිය වෙමි

පසුපස ම මම ද එමි - මගේ පණ ලෙස රකිමි

දිනෙක ගල් මල් වේවි - විස කටුද පිනි වේවි

නුඹලාගේ මාවතට - මලින් පලසක් ඒවි

යහමගට පිවිසෙන්න - ආදරයෙන් දිරිය දුන්

නුඹේ ඔවදන් අපේ - ලොවම එළි කළා

කන්න බැරි පැටවුන්ගේ - බන්ඩි ගෙඩි පුරවලා

බදාගෙන කෑ පැටවූ - බෙදන්නට හුරු කළා

කිළිටි පොඩි පැටික්කියෝ කිරි කොකුන් මෙන් කළා

අපිළිවෙළ පන්තිය ම - පිළිවෙලින් එළි කළා

අමුතු දේවල් කරන

අමුතු ගුරුතුමියගේ

අමුතු ගෝලයෝ පිරිස

ලෙසින් අප නම් වුණා

යහමඟට පිවිසෙන්න - දිරිය ගුණ සුවඳ දුන්

දෙවැනි මව ඔබ ම විය - අපේ යහපත දුටුව.........

තිසරණේ ගුණ බලෙන් - සියලු ශක්තිය ලැබී

ගණදුරට සඳක් වී - සිසු ලොවට එළිය දෙන්

ගොළු කෙල්ලන් කතා පෙට්ටි කළ,

මාණ්ඩම්කාරියන් ජව සම්පන්න කළ

**Hyperactive** කෙල්ලන්

ආදරෙන් දමනය කළ

නිළ නොළත් මනෝ වෛද්‍ය

ගුරුතුමිය

සමන්මලී

ඔබතුමියට සදා ආදරෙයි

උපුටා ගැනීම - ගුරු උපහාර මහාමායා **4B- 2019** දියණියන්



## 11. ආදරණීය ගුරුතුමියට

ලොව පුරා සිසු දණින් පා යුගල නමදිනා

තුති මල් බොහෝ පුදා නෙතු තුති කඳුල පුරවනා

ලොව පුරා සැමදෙනම සිත් තුටින් සමරනා

ඒ සොඳුරු ගුරු දිනය අදයි.......



ලොව පුරා පැතිර ගිය නේක විධ ගුරු කැල අතර

දිසා පාමොක් පරපුරේ ඇඳුරෙකු වන්නට සැමට හැකිවේද,

පැනයක් නැගෙද්දි නිතිපතා අප සිතේ

ඔබව සිහිවේ නිබඳව ම සිත් මලට

පැත්තකට විසිකළ වැඩක් නැති ගලක් ගෙන

කපා ඔප මට්ටම් කර මැණිකක් බිහි කරන

පසෙක ඇති රුක් කඳක් මනා කැටයමක් කරන

ඔබයි ඇඳුරිඳු දිසාපාමොක් කුලය බබළන




ඔප මට්ටම් කළ දහස් සිසු කැළ අතර

අපේ දියණියත් වැජඹේවි හෙට දිනෙක

ඇගේ මුව පොපියන සිනා මල් පොඩි අතර

ඔබේ ආදරේ අපි දකිනවා සැම දිනෙක

පින් ඇත ඔබ ලැබූ පෙර සසර භවයේ

මතු භවයටත් ඔබ රැස් කරයි පින් ඒ විලසේ

පින් සිත් තුතින් දූවගේ මව් පිය ලෙසේ

සියළු දේ සුබ වෙන්න හෙට දිනේ

(දූවකගේ මවකගෙන්) **2019.10.06** ගුරු දිනයදා

ජී. එච්. ඒ. එන්. සමන්මලී

# වර්තමානයට

# 2023.11.11

ඔබ කියවූ උක්ත සටහන නිමවා දැනට වසර 04 ක් පමණ ගත වී ඇත. නව වසරක් වූ මෙ නුවර ගෙවුණු කාලය පුරාවට ම ගුරුතුමියක ලෙස, දූවරුන්ගේ මවක ලෙස, මහාමායා දූවරුන් කෙරෙහි දැක්වූ ආදරණීය සෙනෙහසට බොහෝ රසවත් මතක පිරෙයි.

අද වන් දී පාසලේ සතුටින් ම දැරියන් පිරිස තමන් බව කියමින් ඔවුහු උදම් අණති. පාසලේ සතුටින් ම සිටින ගුරුතුමියන් අතර මම ද එක් අයෙක්මි. මගේ සතුට නිරතුරුව මා අසල සෙනෙහසින් රැඳෙන ආදරණීය දූවරුන්ගේ සිනහවන් ය. දරුවන් තරම් වැඩිහිටි හිත් කියවන්නට දන්නා වෙනත් කවුරුන් හෝ නොමැත. මා විසින් තනා ගෙනෙනා රසම රස බත් පතින් කවා ඔවුනට අනා කවද්දීත් විටෙක ඔවුන් ගෙනෙනා බත් පතින් කටක් අනා මට කවද්දීත් එක ලෙසම දැනෙන්නේ එකිනෙකා අතර ඇති බැඳීමයි.

පාසලේදී යම් සුලු අසනීපයක් වැළඳී හෝ වෙහෙසින් සිටිනා විට ළග දැවටෙමින් සාත්තු සමාත්තු කරද්දී මටම දූවණියන් ලැබුණා සේ මට දැනෙයි.

දරුවන් අනාගත තාක්ෂණික වැඩ ලෝකයට ගැලපෙන ලෙස පුහුණු කරමින් ඔවුන් සතු සියලු බහුවිධ බුද්ධීන් ප්‍රායෝගිකව අත්හදා බලන්නට දරුවන්ට අවස්ථාවන් නිර්මාණය කරන්නට මා ගත් වෙහෙස අපමණ ය. 2023 Mayans Expo අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයේදී මගේ දියණිවරුන් විසින් නිම වූ නව නිපයුම් 15 ක් සඳහා ආරාධනා අමුත්තන්ගේ මනා ප්‍රශංසාවක් ලැබුණු මොහොත සිහි කරන්නේ සතුටිනි.

බොහෝ අභියෝග මැද හරි ම හරි දේ හරියට කරන්නට ඒ කුඩා සිත් තුළ බුද්ධියේත් සංවේදී භාවයේත් විවිධ මානයන් සොයා යන්නට සාධාරණ

උපක්‍රම මගින් සාජු අත්දැකීම් ලබා දෙන්නට මා ගන්නා උත්සාහයන් ඔවුහු නිතර සමරති.

ගුරු දිවියෙහි 18 වසරක් පුරාවට හමු වූ සියළු දරුවන් කෙරෙහි සම සිතින් සිතන්නට ගත් උත්සාහයන් ගුරු වරියක ලෙස මා ලද වටිනාම සැමරුමයි. “දරුවා කාගේ ද නොව කාගේ වුව දරුවෙකි”. ඒ සමානාත්මතාවය සිසු දරුවන් කෙරෙහි හදෙහි රැඳෙන උතුම් දයාවන් තුළ පිහිටා කටයුතු කරන විට සිතට දැනෙන අස්වැසිල්ල අති මහත්ය. 18 වසරකට ඉහතදී හමුවූ දරුවන්ට ද තවම මේ ගුරුතුමියගේ මතකය සුන්දර වී ඇත්තේ එහෙයිනි. ඔවුහු තවමත් නොවැම්බර් මස 11 වන දින මාගේ උපන් දිනය දා මධ්‍යම රාත්‍රී 12.00 ට සුභ පැතීමට අමතක නොකරති.

සැමදා උදෑසන විනාඩි 10 පමණ දවසේ කිසියම් හෝ ලැබූ අත්දැකීමක් රසකර පවසද්දී මුව අයාගෙන බලා සිටින දැරියෝ ඒ කතා වලින් බොහෝ ජීවිත ආදර්ශ ලබති. වාර සටහන්හි විෂය නිර්දේශයන්හි සැගව ඇති ජීවිතයේ ප්‍රායෝගික යථාර්ථයන් තෝරා, බේරා, පෙරා දරුවන්ට අත්දැකීම් ලෙස ලබා දීම ගුරුවරුන්ගේ යුතුකමයි. ඒ යුතුකමෙහි අධිෂ්ඨානයෙන් නියැලෙන ගුරුභවතුන් දරුවන්ගේ නොමද ප්‍රශංශාවට ලක් වේ. මා ද එවැන්නියකි.

දරුවන්ගේ ප්‍රාථමික පාසල් කාලයට මිහිරියාවක් එක් කරන්නට මට හැකි දෑ අපහසු දෑ පවා ආයාසයෙන් කිරීමට සිදුව තිබේ. සියල්ල අවසන ඔවුන්ගේ සිනහ පිරී මුහුණු දකින විට දැනෙන සතුට කියා නිම කළ නොහැකි ය. අධ්‍යාපන කටයුතු මෙන් ම විෂය සමගාමී ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ද ජීවිතය දිනනට අත්‍යාවශ්‍ය උතුම් මානවීය ගුණාංග ද සමබරව උගත යුතු බවත් භාවිත කළ යුතු බවත් මම ඔවුනට ආදරයෙන් කියා දෙන්නෙමි. යළි දිනෙක ලොකු දැඩි වී සමාජයට තනිව පිවිසෙන දින ප්‍රාථමික පාසලේ දී මා ඇසුරේ උගත් බොහෝ සාරාර්ථ ප්‍රයෝජනවත් වී ඇති බව ඔවුන්ට සිහි වනු ඇත.

පාසලේ රාජකාරිමය කටයුතු ද, මා විසින් කරන විවිධ සමාජ සේවා කටයුතු ද අවුරුදු 07 ක පුතණුවකුගේ ආදරණීය මවක සහ මගේ සැමියාට ආදරණීය බිරිඳක ලෙස පෞද්ගලික ජීවිතයේ කටයුතු ද අද වන් දී සමබරව

කරගෙන යාමට මෙම පරිසරයේදී මා හට ලැබුණු විවිධ අභියෝග ජීවිත අත්දැකීම් මා හට පිටුවහලක් වී ඇත. ඒ සියලු අත්දැකීම් ලබන්නට හේතු වූ සියලු පරිසරාත්මක සහ මානවීම සාධක වලට මම ස්තූතිවන්ත වෙමි. අතීතය දෙස හැරී බලද්දී ඇති වන්නේ සතුටකි. දෙව්ලොව ගොස් සිටින මාගේ ආදරණීය මව ද පියා ද සියලු කල්හි මා දෙස බලා සිටිනා බව මට දැනෙයි. සියලු උවදුරු වලින් ඔවුන් මා ආරක්ෂා කරන බව මට හැගෙයි. ඔවුන් මා අසල ඇති බව මට දැනෙයි. අද මා සතුටිනි. මා ඇසුරේ සිටින සියල්ලෝම පාහේ සතුටිනි.

දිවි ගමනේ නේක අභියෝග මැදින් ගමන් කළ මගේ ජීවිත කථාවේ අතරතුර සිදුවූ සියල්ල දකින්නට "The Diary of Sensitive Teacher" "සංවේදී ගුරුවරියකගේ දිනපොත" කෘතිය ඔබ වෙත තිළිණ වන තෙක් බලා සිටින්න. සමහර විට එය ඔබේ කථාව ද විය හැකිය.

දුළඳා සමිඳු පිහිටයි
2023.11.11
මහනුවර දී

# ඇමුණුම් - 01

2021.03.31

විදුහල්පතිතුමිය,
මහ/මහාමායා බාලිකා විදුහල,
මහනුවර.

ගරු විදුහල්පතිතුමියනි,

## ස්තූති පූර්වක ඇගයීමයි.

21 වෙනි ශතවර්ෂයකට ගැළපෙන අධ්‍යාපන ඥානය උරුම කරගත්, දරුවන් වෙනුවෙන් සිය කාලය ශ්‍රමය කැප කරමින් තම ගුරුභූමිකාවේ වගකීම් මනා ලෙස ඉටු කරන අද්විතීය ගුරු චරිතයක් පිළිබඳව ස්තූති පූර්වකව සිදු කෙරෙන ඇගයීමයි.

ඇය 21 වෙනි සියවසේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ඉතා පුළුල් දැක්මකින් යුක්ත වූ, ඒ පිළිබඳව මනා ලෙස අධ්‍යයනයක යෙදුණු හා ඒ සම්බන්ධ පර්යේෂණ සිදුකල ගුරුමහත්මියකි. දරුවන් වෙනුවෙන්, දරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින්, ඔවුන්ගේ අත්දැකීම් තුළින් තම ඉගැන්වීම් කටයුතු සැලසුම් කරගනිමින් මනා ලෙස ගුරු භූමිකාව කළමනාකරණය කරගත් ගුරුමාතාවකි.

දරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා තම කාලය, ශ්‍රමය කැප කරමින් ඉමහත් වු පරිශ්‍රමයක් දරමින් ඔවුන් උපරිම නිපුණතාවය කරා යොමු කිරීමට අදාළ වූ විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කරමින්, දරුවන් හට ඉතා උද්යෝගීමත් ඉගෙනුම් ක්‍රියාවලියක් ලබා දීමට හැකි සෑම විටම උත්සාහ දරා ඇති බව පහත කරුණු වලින් මනාව පැහැදිලි වේ.

- ❖ දරුවන්ගේ නිර්මාණශීලි හැකියා වර්ධනයට හා ඔවුන්ට අදාළ නිපුණතා ලබා දීම සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වලට දරුවන් යොමු කල ආකාරය ඉතා අගය කල යුතුය. ඒ සඳහා පාඩම අවසන් වීමෙන් අනතුරුව මිනිත්තු 10 ක් වැනි ඉතා කෙටි කාලයක් යොදාගෙන සරල නිර්මාණයක් සිදුකිරීමට සෑම දරුවකුටම අවස්ථාව ලබා දෙන ලදී. මේ ආකාරයට පාඩම අවසානයේ දරුවන්ට සැහැල්ලු මනසක් ගොඩනගා ගැනීමට මෙය මහත් රුකුලක් වූ බව දෙමව්පියන් වශයෙන් අපට මනාව පැහැදිලි විය.

- ❖ එසේම දරුවන්ගේ විවිධ කුසලතා වර්ධනය කිරීමට හා වැඩ ලෝකයට සවිමත් පුද්ගලයකු දායාද කිරීමේ අරමුණින් විවිධ ආහාර වර්ග සැකසීමේ ක්‍රම හා ඒවායේ ගුණ පිළිබඳව අධ්‍යයනයට දරුවන් යොමු කිරීම එතුමිය විසින් සිදු කරන ලද පුවිශේෂී කාර්යයකි. දරුවන් මෙවැනි වු කටයුතු

වල යෙදීම මගින්, නිවසේ දී දෙමාපියන් හට තම කටයුතු පහසු කරගැනීම සඳහා දරුවන් ද දායක කරගැනීමට හැකිවීම ඉමහත් වූ අස්වැසිල්ලකි. එසේම මෙවැනි කටයුතු තුලින් වැඩ ලෝකයට දක්ෂ දරුවන් බිහිකිරීමට ද හැකියාව ලැබෙන බව මනාව පැහැදිලි වේ.

- තමාට අවශ්‍ය පෝෂණ අවශ්‍යතා තම නිවස අවට පරිසරයෙන් ලබාගැනීමට ද, නිවසේ ආර්ථිකයට පහසු වීමට මෙන්ම තම නිවස අවට පරිසරය ක්‍රමවත්ව හා පිළිවලයට සකස් කරගැනීම යන අරමුණු ඉටු කරගැනීම සඳහා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකමක් ලෙස ගෙවත්ත සැකසීම ඉතාම අගනා කටයුත්තක් ලෙස දකිමු. මෙයින් දරුවන් හට භූමිය සකස් කිරීම, බීජ ප්‍රරෝහණය වන ආකාරය, බෝග වර්ධනය, පොහොර යෙදීම, පැළ නඩත්තු කිරීම, අස්වනු නෙලීම ආදී කටයුතු පිළිබඳව ප්‍රායෝගිකව අත්දැකීම් සමූහයක් ලබාගැනීමට අවස්ථාව ලැබුණි. දෙමව්පියන් වශයෙන් අපට මෙය මහත් වූ සතුටට කරුණක් විය.

- එසේම, තම උපන් දිනය වෙනුවෙන් උත්සව පවත්වා සතුටුවීම වෙනුවට උපන්දින පිංකමක් සිදුකිරීමට දරුවන් හුරුකරවීම ඉතාම සුවිශේෂී වූ කටයුත්තක් ලෙස දකිමු. මෙය බුද්ධ ධර්මය විෂයට අදාළ නිපුණතාවයක් තහවුරු කරගැනීමේ අරමුණින්, ගුරුමහත්මිය විසින් දරුවන් යොමු කරන ලද ඉතාම උතුම් කටයුත්තකි. අවවාදයට වඩා ආදර්ශය උතුම් බව පසක් කරමින, ගුරුමහත්මිය තම උපන්දිනය රෝගාතුරව සිටි තම නැන්දම්මියගේ සුව පහසුව වෙනුවෙන් කැප කළාය. එසේම ඇය සිටි රෝහල් වාට්ටුවට පරිත්‍යාගයක් ද සිදු කළාය. මෙය දරුවන්ට මෙන්ම, දෙමාපියන් වශයෙන් අපට ද මහත් ආදර්ශයක් විය. මෙය ආදර්ශයට ගනිමින් දරුවන් මෙන්ම අපද උපන් දිනය වෙනුවෙන් සුළු හෝ පිංකමක් සිදු කිරීමට යොමුවීම, ගුරුමහත්මියගේ වෑයමෙහි ප්‍රතිඵලයකි.

- දරුවන් කියවීම සඳහා ලැදියාව අඩු බව වැටහීයාමත් සමග, ඔවුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා කියවීම් මුල්ලක් සකස් කිරීමට යොමු කරවීම ද ඉතාම අගය කලයුතු කටයුත්තකි. තම නිවසේ තමන්ට ගැලපෙන ආකාරයට ඉතාම අලංකාරවත් අන්දමින් කියවීම් මුල්ලක් දරුවන් වෙනුවෙන් දෙමව්පියන් විසින් සකස් කරදීම මෙහිදී සිදුවිය. අදටත් අප දරුවන් කියවීම් මුල්ලේ දිගා වී මහත් ඕනෑකමින් පොත් කියවනු දුටු විට, දෙමාපියන් වශයෙන් අපේ දෑස් තෙත් වූ වාර ගණන අපමණය. එසේවන වාරයක් පාසා අපට දෙවි කෙනෙකු මෙන් සිහි වන්නේ මෙම ආදරණීය ගුරුමෑණියන්ය.

- මෙම කියවීම් මුල්ල සංකල්පය පන්තිකාමරය දක්වා විහිදී ගොස් අලංකාරවත් පන්ති පුස්තකාලයක් නිර්මාණය විය. අප දරුවන් පන්ති පුස්තකාලයේ පොත් කියවමින් මහත් ආශ්වාදයක් විඳිනු දැකීම ඉමහත් සතුටට කරුණකි.

❖ එසේම, දරුවන්ගේ ගැටළු අවබෝධ කර ගනිමින් ඔවුන් සමග ඉතාම සමීපව කටයුතු කරමින් එම ගැටළු නිරාකරණය කිරීමට ගත් උත්සාහය ඉතාම ප්‍රශංසනීය වේ. දරුවන් හා සම්බන්ධ ගැටළු විසඳීමේ දී ඇය සතුවූයේ ඉතාම දක්ෂ උපදේශනවරයකු සතු ගුණාංගයි. එමගින් ගැටළු සහගත දරුවන්, එම ගැටළු තත්ව මග හරවා ගෙන පන්ති කාමරය තුළ ඉතාම ක්‍රියාශීලී ආකාරයෙන් තම ක්‍රියාකාරකම් සිදුකරගෙන යන ආකාරය දැකගැනීමට හැකිවීම දෙමව්පියන් වශයෙන් අප ලද භාග්‍යයක් කොට සලකමු.

ගරු විදුහල්පතිතුමියනි,

කිවයුතු සියල්ල බොහෝ නමුත් සවිස්තරාත්මකව ඒ සියල්ල ලිපියක් මගින් ඉදිරිපත් කිරීමට නොහැකිවීම ගැන අප කණගාටු වෙමු. නමුත් කිවයුතු සුවිශේෂී හා ප්‍රබලම කාරණය වන්නේ, මෙම ක්‍රියාකාරකම් සඳහා ඉගෙනුම් අවස්ථා සියල්ලම අප දරුවන් හට දායාද කරන ලද්දේ කොවිඩ් වසංගත සමයේ Online පන්තිය හරහා වීමයි. ගුරුමහත්මියගේ මහා කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස Online පන්තිය ඉතා සාර්ථක මෙහෙයුමක අවසන් ප්‍රතිඵලය ලෙස නිපුණතා වලින් පිරිපුන් ඉතාම නිර්මාණශීලී, උද්‍යෝගිමත් දරුවන් පිරිසක් බිහිවී සිටිනු දැකීම ඉමහත් සතුටට කරුණකි.

වර්තමානයේ හඳුන්වාදෙන ලද පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD) යටතේ ගොඩනගාගත යුතු ගුරුවරයකුට අදාළ සියලුම ගති ලක්ෂණ වලින් මනාව පිරිපුන්, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ඉතා පුළුල්ව හොඳින් අවබෝධ කරගත් ගුරු මහත්මියක ලෙස මෙතුමිය දරුවන් වෙනුවෙන් කරන ලද කැපවීම අති මහත් කොට සලකමු.

කොවිඩ් වසංගත තත්වය ආරම්භක සමය වන විටත් Smart ජංගම දූරකථනයක් ඇය සතුව නොතිබුණත්, දරුවන් වෙනුවෙන් Online පන්තිය සිදුකිරීම සඳහා ජංගම දූරකථනයක් මිලදී ගෙන, ඉතා ඉක්මනින් එම තාක්ෂණය ඇය ග්‍රහණය කර ගත්තාය. එමගින් බාධක මැද ඉතා විශ්මය ජනක වූ ඉගෙනුම් අවස්ථා දරුවන්ට උරුම කර දීමට ඇය සමත් වූවාය.

සිය එකම පුතණුවන්ගේ දුක සැප, ඕනෑ එපාකම් හමුවේ ඒවා දෙවැනි කොට සලකමින් තම පන්තියේ දරුවන්ගේ ඉගෙනුම් අවශ්‍යතා මග නොහැර ඉටු කිරීමට ඇය සෑම විටම වගබලා ගත්තාය. තම දරුවාගේ කුසගින්න, නින්ද, රෝග පීඩා පවා පසෙක තබා දිරියෙන් තම Online පන්තිය මෙහෙය වූ ඇය, විටක තම පුතණුවන්ද විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සහායට යොදා ගත්තාය. මෙවැනි වූ බාධක දුක් කම්කටොලු මැද තම රාජකාරිය ඇය මැනවින් ඉටු කිරීමට සමත් වූවාය.

මෙසේ සියලු ආකාරයෙන් ශක්තිමත් වූ මෙම ගුරු මහත්මිය, විෂය නිර්දේශයට අදාළ සියලු නිපුණතා තහවුරු වන පරිදි සියලු පාඩම් සම්පූර්ණයෙන්ම ආවරණය කළාය. දීර්ඝ බෙදීම හා ගෙනයාම් සහිත එකතු කිරීම පාඩම් දෙක ක්‍රියාකාරකම් පාදකව සිදුකල යුතු වූ බැවින්, එය පාසල ආරම්භ වූ පසුව පන්ති කාමරයේ දී සිදුකර, එම නිපුණතාවයන් ද මනාව තහවුරු කරගැනීමට සමත් වූවාය.

මෙම සියලු අත්දැකීම් දරුවන්ට ලබාදෙන අතරම, ඇය සියලු දරුවන් කෙරෙහි සමාන සැලකිල්ලක් දැක්වීම ඉතාම සුවිශේෂී වූ ලක්ෂණයක් විය. කිසිම දරුවකුට විශේෂයක් නොදැක්වූ ඇය, එක් එක් දරුවාට අනන්‍ය වූ ලක්ෂණ හඳුනාගනිමින් ඔවුන් දිරිමත් කළාය. ගුරු භූමිකාව තුළ දැකිය යුතු ඉතාම උසස් ගුණාංගයක් වන සමානාත්මතාවය ඇය ඒ තුළින් ඉස්මතු කළාය.

දෙමවුපියන් වශයෙන් අප දරුවන්ගේ ධනාත්මක වූ වෙනස මනාව අවබෝධ කරගනිමින් සිටින මෙවැනි වූ මොහොතක අප සියලු දෙනාම එතුමිය ඉතා ස්තූති පූර්වකව සිහිපත් කරමු. අවසාන වශයෙන් මෙම කථාවේ කථානායිකාව වන මහාමායා බාලිකා විද්‍යාලයේ 4 C ශ්‍රේණියේ සමන්මලී ගුරුමෑණියන් හට ඉදිරි කටයුතු සාර්ථක කරගනිමින් තම වෘත්තීය ජීවිතයේ උසස් ස්ථානයකට ගමන් කිරීමට හැකියාව ලැබේවායි දෙමව්පියන් වශයෙන් අප ප්‍රාර්ථනා කරමු.

ස්තූතියි,

මෙයට,

2021 මහාමායා බාලිකා විද්‍යාලයේ

4 C ශ්‍රේණියේ දෙමාපියන්

2023.07.31 වන දින

ගරු විදුහල්පතිතුමිය,
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

**ගෞරවණීය සේවය ඇගයීමයි.**

යුගයේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ප්‍රායෝගික නිපුණතාවයන්ගෙන් දරුවන් පෝෂණය කිරීමට මහත් වෙහෙසක් දරන 4-B ශ්‍රේණියේ සමන්මලී ගුරුමෑණියන්ගේ සේවය ඇගයීම අපගේ යුතුකමක් සේ සිතූ බැවින් මෙම ලිපිය ඔබ තුමිය වෙත යොමු කරන්නට අප සිතුවෙමු .

සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවෙන් බැහැරට ගොස් නව්‍ය යථාර්තය වෙත දරුවන් ගෙනයාම අභිලාෂ කොටගත් එතුමියගේ ගුරු හරුකම් මධ්‍යයයේ අපගේ දරුවන් මේ වනවිට යහපත් පරිවර්තනයකට ලක්වෙමින් සිටියි .

විශේෂයෙන් සෑම දරුවෙකුගේම හැකියාවන් හොඳින් අවබෝධ කොටගනිමින් ඔවුන් ඉදිරියේ විවිධ අවස්ථාවන් නිර්මාණය කරමින් ඔවුන්ගේ මානසික හා පෞරුෂ වර්ධනයට එතුමියටම අවේණික වූ ක්‍රම ශිල්ප භාවිතා කිරීම විශේෂයෙන් පැසසිය යුතු කරුණකි .

දරුවන්ගේ ඉදිරිපත් වීමේ හැකියාව , පිළිවෙල , නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරමින් සමබර ලෙස අධ්‍යාපන හැකියාවන් දියුණු කර කිසිදු දරුවෙකු අත්නොහැර තම ඉලක්කය වෙත දරුවන් රැගෙන යාමට ඇයගේ පෞද්ගලික ජීවිතය ද පසෙකලා දරන වෙහෙස මහසිය ද ඉතා අගය කොට සලකමු.

පන්ති ආරම්භයේදී එතුමියත් දෙමාපියනුත් හරිහැටි හඳුනාගැනීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් මත යම් යම් ගැටලුකාරී තත්වයන් ඇතිවුන ද මේ වන විට අති බහුතරයක් දෙමාපියන්ගේ නොමද ආදරයට හා ගෞරවයට එතුමිය පත්ව ඇති බව ද කාරුණිකව සිහිපත් කරමු . එසේම නිරන්තර ක්‍රියාශීලි අයෙකු විවේචනයට දෝෂයට ලක්විමෙ සමාජයේ සුලභ කරුණක් සේ ද අප දක්මු . මෙසේ දෙමාපියන් හඳුනා නොගැනීම සඳහා ප්‍රධාන හේතුව වූයේ 3 ශ්‍රේණිය ආරම්භයත් සමග රටේ පැවති කොරෝනා වසංගතය හමුවේ දෙමාපිය රැස්වීමක් ලබා ගැනීමට නොහැකි වීමයි.

සමාජයේ හා පරිසරයේ යම් යහපත් දෙයක් ඇත්නම් නොපමාව තම දියණියන් වෙත ගෙන ඒම එතුමියට නිරායාසයෙන් සිදුවන ක්‍රියාවකි. නිරන්තරයෙන් ක්‍රීඩාව , කලාව , සෞන්දර්යය , යන අංශ වෙත දරුවන් යොමු කිරීමටත් එසේ යොමුවන දරුවන් ඉහළින් ඇගයීමත් තවත් නිරායාසයෙන් සිදුවන්නකි.

"කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන පරමාර්ථය ඉෂ්ඨ සිද්ධ කිරීමෙහිලා පන්ති පුස්තකාලය ආරම්භ කිරීම මෙතුමියගේ විශේෂ මෙහෙවරක් ලෙස අපි දකින්නෙමු. සිංහල භාෂාවට අමතරව ඉංග්‍රිසි භාෂාවට අයත් පොත් කියවීමට වැඩි වශයෙන් යොමු වීමට මෙම පංති පුස්තකාලය බෙහෙවින් උපයෝගී වී ඇත. මෙම පංති පුස්තකාලය ආරම්භ වූයේ දෙමාපියන් වන අපගේ කැපවීම මත නොව පංති භාර ගුරුතුමිය වශයෙන් ඇයගේ කැපවීම මෙන්ම ඇයගේ පෞද්ගලික දන පරිත්‍යාගයෙන් වීම සුවිශේෂී හේතුවකි.

දියණියන් නායකත්වයට හුරු කිරීමෙහිලා පංතියේ සිටින සියළුම දියණිවරුන් හට මොන යම් හෝ දෙයකට නායකත්වයක් ලබා දී හෙට දින ලෝකය දිනන්ට සිටින අපගේ දියණිවරුන් නායකත්වයට හුරු කිරීම මෙතුමිය විසින් කරන සුවිශේෂී ක්‍රියාවකි.

බොහෝවිට පිළිවෙල පිරිසිදු බව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරමින් දරුවන් හුරුකිරීමට වෙහෙසෙන එතුමිය දැනුමෙන් හා ගුණවත් බවින් පිරිපුන් මහාමායාවියන් දැයට දායාද කිරීමට දරන වෙහෙස ජාතික මෙහෙවරක්සේ ද අප දකින අප එතුමියට හදපිරි ස්තූතිය පුද කර සිටිමු.

මහාමායා බාලිකා විද්‍යාලයේ 4 ශ්‍රේණිය බි පංතියේ සමන්මලී ගුරුමෑණියන් හට ඉදිරි කටයුතු සර්ව ප්‍රකාරයෙන් සාර්ථක වී, ගුරු ජීවිතයේ ද උසස් තත්වයකට යාමටත් උතුම් දළදා සමිඳුගේ පිහිට ආශිර්වාදය ලැබේවා යැයි දෙමාපියන් වන අප අවසාන වශයෙන් ප්‍රාර්ථනා කර සිටින්නෙමු.

**ස්තූතියි,**

**මෙයට,**

**4 ශ්‍රේණිය බි දෙමාපියන් - 2023**

පිටපත් :- 1. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා - මහනුවර
2. විදුහල්පතිතුමිය - ප්‍රාථමික අංශය, මහාමායා බාලිකා විදුහල,
3. සමන්මලි ගුරුතුමිය- 4 ශ්‍රේණිය බි, මහාමායා බාලිකා විදුහල

පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සූදානම් කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය. එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය. ඔවුන් සමාජයේ පෙරගමන්කරුවන් නිසා සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යවත් කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයක් වීමද අත්‍යාවශ්‍ය වෙයි. තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි.

මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොටගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය. ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි. මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමග පොත් ලියන හෙරණගත්කරණී ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුන්ට ද ආදර්ශයකි. ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුබ පැතුම්.

හෙරගත්කරණී නිර්මාතෘ

සෙනෙවිරත්න මහලේකම්

**2025- 02-08**